# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,749—1959 මැයි 25 වැනි සඳුද — 25.5.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

සීනි " තොග වෙළඳාම "

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**බී. ඊ. 65 වෙනි අංකය ආහාර මිල නියෝගය**

**නියෝගය**

මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් ජෝසප් වැලැන්වායින් පොන්සේකා වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 12 වෙනි දරණ වගන්තිය " 1 " " ආ " සමග කියවිය යුතු 4 වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1956 මැයි මස 18 වෙනි දින අංක 10,930 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද, 1956 මැයි මස 11 වෙනි දින අංක බී.ඊ.54 දරණ ආහාර මිළ නියෝගයේ සඳහන් සුද්ධ කළ සුදු සීනි සහ දුඹුරු සීනි පිළිබඳව තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ මෙම නියෝගයෙන් 1959 මැයි මස 1 වෙනි දින සිට අවලංගු කරමි.

(2) 1වෙනි උපලේඛනයේ සඳහන්වූ දුඹුරු සීනි තොග වශයෙන් විකිණීමේදී දල බර හොණ්ඩරයක්ද සහ සුද්ධ කළ සුදු සීනි තොග වශයෙන් විකිණීමේදී දල බර හොණ්ඩරයක්ද 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දින පටන් මෙහිම 2 වෙනි 3 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) නැවතත් විකිණීම පිණිස සීනි තොග වශයෙන් විකිණීමේදී හෝ දලබර වශයෙන් හොණ්ඩර ගණනේ විකිණීමද එම විකිණීම තොග වෙළඳාම හැටියට සලකනු ලැබේ.

(ආ) සීනි යන්නෙන් හකුරු වර්ගයට අයත් සියල්ලක්ම ඇතුලත් නොවේ.

(4) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනලද සෑම ප්‍රදේශයකම සීනි වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) එසේම යම් ස්ථානයක හෝ වාහනයක සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තිබිය යුතු බව නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරන ලැබූ සෑම ප්‍රදේශයකම සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ සීනි ප්‍රමාණය බර අනුව,

(ඇ) විකුණූ සීනි බර ප්‍රමාණය සඳහා ගෙවූ මුදල සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළෙඳාම තොග වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

1959 මැයි මස 15 වෙනි දින අ.භා. 3.00 මඩකලපු කච්චේරියේදී අත්සන් කරන ලදී.

ජේ. වී. පොන්සේකා,
මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර
මිළ පාලක තැන.


1297—ජේ. ඇන්. ආර් 2073—4,200 (5/59)

## 1 වෙනි උප ලේඛනය

විස්තර සහ ශ්‍රෙණිය

දුඹුරු සීනි.
සුද්ධ කළ සුදු සීනි.

## 2 වෙනි උප ලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ දුඹුරු සීනි<br>රු. ශ. | 3 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ සුද්ධ කළ සුදු සීනි<br>රු. ශ. |
|---|---|---|
| 1. මඩකලපුව මන්මුන උතුර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... | 61 25 ... | 68 23 |
| 2. ඒරාවූර්, කෝරලේ පත්තු වාලසේන හා සෙන්කලඩි ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... ... | 61 25 ... | 68 23 |
| 3. මන්මුන දකුණු හා එරුවිල් පෝරතිවු පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... | 61 25 ... | 68 23 |
| 4. කරවාකු පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... | 61 68 ... | 68 68 |
| 5. සම්මාන්තුර සහ වැව්ගම් පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයෙහි සම්මාන්තුර, අම්පාර සහ පරගහ කැලේ ... ... ... ... | 62 90 ... | 69 00 |
| 6. අක්කරපත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... | 61 50 ... | 69 50 |
| 7. පානම පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... | 61 50 ... | 69 50 |
| 8. බින්තැන්න පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයෙහි මහඔය, සේරන්කඩ සහ පදියතලාව ... ... ... ... | 62 43 ... | 69 63 |

---

## 1950 අංක 25 දරණ ආහාර පාලන පණත

බර අනුව සහල් විකිණීම

1952 ආහාර පාලන රෙගුලාසිවල "ඊ" ශීර්ෂයේ IIවෙනි කොටසේ 5 වෙනි රෙගුලාසිය සහ "ඊ" ශීර්ෂයේ III වෙනි කොටසේ 4 (1) දරණ රෙගුලාසිය අනුව, 1959 මැයි 25 වැනි දින සිට, සලාක ක්‍රමය බලපැවැත්වන මඩකලපුව හා පුත්තලම් යන දිස්ත්‍රික්ක තුළ පදිංචි, මීට යාකොට ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසියම් පංතියකට අයත් සලාක පොතක් හිමි කෙනෙකුට, සතියකට බර අනුව විකිණිය යුතු හෝ නිකුත් කළ යුතු හාල් සලාකය එම උපලේඛනයේ එක එක පංතිය ඉදිරියෙන් 2 වෙනි තීරයේ සඳහන් කොට ඇති සහල් ප්‍රමාණය බව මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| 1 වෙනි තීරය<br>පංතිය | 2 වෙනි තීරය<br>හාල් (රාත්තල් වලින් |
|---|---|
| ළදරුවා ... ... ... ... ... | 4 |
| ළමයා ... ... ... ... ... | 4 |
| සාමාන්‍ය ... ... ... ... ... | 4 |
| කම්කරුවා ... ... ... ... ... | 4 |

සැ. යු.—හාල් සේරු 1ක් රාත්තල් 2කට සමාන වේ. කූපන් දුන්විට පාරිභෝගිකයින්ට සලාක පොතක් සඳහා සතියකට හාල් සේරු 2ක් වෙනුවට මේ අනුව රාත්තල් හතරක් වශයෙන් හාල් ලැබෙනවා ඇත.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර පාලක සහ ආහාර කොමසාරිස්.

1959 මැයි 25 දින,
කොළඹ දී ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී